# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1349 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 20/08/2024 පැය 1845

**මාධ්‍ය නිවේදනය**

**කායවර්ධන තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.**

ශ්‍රී ලංකා කායවර්ධන සහ ශාරීරික යෝග්‍යතා සම්මේලනය සමඟින් මාතර ඔෂෝන් කායවර්ධන මධ්‍යස්ථානය එක්ව සංවිධානය කරනු ලැබූ "2024 Mr. Matara" කායවර්ධන ශූරතාවලිය **2024.08.18 වන දින මාතර සමූපාකාර රංග ශාලාවේදී** පැවත්විණි.

මෙම තරඟාවලියට දිවයින පුරා විසිරී සිටින කායවර්ධන ක්‍රීඩා සමාජ 20 කට අධික සංඛ්‍යාවකින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 50 කට අධික ප්‍රමාණයක් විවිධ බර පන්ති යටතේ සහභාගි විය. ශ්‍රී ලංකා පොලිස් කායවර්ධන කණ්ඩායමේ ක්‍රීඩකයින් දෙදෙනෙකුද මෙම තරඟාවලියට සහභාගී විය. ඒ අනුව පොලිස් කොස්තාපල් 79430 එස්.ජී. බරණසූරිය නිලධාරියා Physics කාණ්ඩ බර පන්තිය යටතේ ප්‍රථම ස්ථානය දිනා ගත් අතර පොලිස් කොස්තාපල් 85288 ඩබ්.එන්. දර්ශණ නිලධාරියා කිලෝ 80 ට වැඩි බර පන්තියේ යටතේ ප්‍රථම ස්ථානය දිනා ගෙන ශ්‍රී ලංකා පොලීසියට විශිෂ්ඨ කීර්තියක් අත්කර දීමට සමත් වී ඇත.

ශ්‍රී ලංකා පොලිස් කායවර්ධන සංගමයේ සභාපති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා කටයුතු කරන අතර ලේකම් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩී.ජී.එච්. ප්‍රශාන්ත, පුහුණුකරු ලෙස නිරංජන් කුමාර, කළමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක කේ.බී.එන්. කොඩිතුවක්කු හා කණ්ඩායම් නායක පොලිස් සැරයන් 12190 කේ.ඩී. මායාදුන්න යන මහත්වරු කටයුතු කරයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප**


Mr.Matara
BODYBUILDING CHAMPIONSHIP - 2024
IFBB
MESSI
CITY ELEGANCE


Mr.Matara
IFBB
MAIN SPONSOR
YARA HOLDINGS
SPEED
AMI




පොලිස් මාධ්‍ය කොට්ඨාසය.